**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2014**

-----------------------------------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 10(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත අරමුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාර සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු එකී පනතේ 10(4) වගන්තියෙහි සඳහන් අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ මාගේ වාර්තාව පහත සඳහන් ඡේදයන්හිද, ආදායම් හා වියදම් ප්‍රකාශනය ඇමුණුම් අංක 01 ලෙසද, අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම් අංක 02 ලෙසද දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

ජාතික අක්ෂි රෝහලේ ආපනශාලාව ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ලබා දුන් රු.571,200 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අත්තිකාරමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පළමු කොටස් මුදල් ගෙවීමේදී අඩුකර තිබුණු රඳවුම් මුදල් රු.79,154 ක් ගිණුම්ගතකර නොතිබුණි.

2.3 **ලැබිය යුතු ගිණුම්**

හම්බන්තොට ඉදිකිරීම් ව්‍යාපෘතියක් සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලබාදී තිබූ මුදලින් ඉතිරි රු.10,000 ක් වර්ෂ 3 කට අධික කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛයේ 04 වගන්තියේ xiv උප ඡේදයට පටහැනිව මාසික වැටුප් සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 25 කදී එකතුව රු.120,370 ක් ජාතික අක්ෂි බැංකුවේ නිලධාරීන් 7 දෙනෙක් වෙත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව අමතර සේවා දීමනා ලෙස ගෙවා තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම්වලින් වූ අතිරික්තය රු.49,171,867 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 46,900,783 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.96,072,650 ක වර්ධනයක් සිදුවී තිබුණි. ඒ සඳහා සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් රු.115,189,472 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

.

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෘෂ්‍යාබාධිත සිසුන් 3000 ක් වෙත ඇස් කණ්නාඩි ලබාදීමට විදේශීය රාජ්‍යයක් විසින් රු.3,044,000 ක පරිත්‍යාගයක් කර තිබුණු අතර, අදාළ පාර්ශව අතරවූ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව 2014 සැප්තැම්බර් 30 දිනට ප්‍රථම කාර්යය නිම කළ යුතු විය. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරූ අමාත්‍යාංශයේ විෂන් 2020 ව්‍යාපෘතිය වෙත

සමාලෝචිත වර්ෂයේදී රු.2,289,402 ක් ලබාදී තිබුණද, සුදුසු සිසුන් හඳුනා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය  අවසන් වන විට රු.1,103,763 ක් වැයකර සිසුන් 891 කට පමණක් ඇස් කණ්නාඩි ලබා දී තිබුණි. එහිදී භෞතික කාර්යසාධනය සියයට 30 ක් පමණක් විය.

(ආ) කාන්තා හිංසනය පිටුදැකීමේ වැඩමුළු 5 ක් පැවැත්වීමට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබාදීමට එකඟවී තිබුණු රු.605,000 න් රු.484,000 ක් 2013 සැප්තැම්බර් 13 දින ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය වෙත ලබාදී තිබුණි. අදාළ වැඩමුළු 2013 ඔක්තෝබර් හා නොවැම්බර් මාසයන්හි පවත්වා අවසන් කළ යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.168,110 ක් වැයකර වැඩමුළු 2 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) පෝලියෝ ප්‍රතිදේහ පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම සඳහා 2013 සහ 2014 වර්ෂවලදී විදේශීය රාජ්‍යයක් විසින් රු.2,197,150 ක් පරිත්‍යාග කර තිබුණි. ව්‍යාපෘති යෝජනාව අනුව සමීක්ෂණය 2013 අප්‍රේල් මාසයේදී ආරම්භ කර 2014 දෙසැම්බර් මාසයේදී අවසන් කළ යුතු වුවද 2015 සැප්තැම්බර් 15 වන විටත්, ව්‍යාපෘතිය නිම කර අවසන් පර්යේෂණ වාර්තාව ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බ්ලැක් කාබන් අධ්‍යයන ව්‍යාපෘතිය නමින් වර්ෂ 4 ක පර්යේෂණයක් සිදු කිරීම සඳහා විදේශීය රාජ්‍යයක් විසින් පසුගිය හා සමාලෝචිත වර්ෂය තුළදී රු.10,387,382 ක් පරිත්‍යාග කර තිබුණි. ව්‍යාපෘති කටයුතු 2013 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර පර්යේෂණ කටයුතු සඳහා ඉලක්කගත මව්වරු 475 ක් තෝරා ගැනීම හා ඔවුන් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර තොරතුරු ලබාගැනීම  2014 පෙබරවාරි මාසයේදී අවසන් කිරීමට නියමිත විය. නමුත් 2014 දෙසැම්බර් 31 වන විටත් තෝරාගෙන තිබූ මව්වරු සංඛ්‍යාව 391 ක්  හා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර තොරතුරු ලබාගත් මව්වරු සංඛ්‍යාව 341 ක් විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැමිණීම් හා පිටවීම් වේලාවන් සනාථ කර ගැනීමකින් තොරව ජාතික අක්ෂි බැංකුවේ හෙද නිලධාරීන් හා සහායක නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.2,368,622 ක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 3 තුළදී එක් එක් වර්ෂයේදී පොදු අරමුදලින් වැය කර තිබුණු මුදල මෙන්  ඉතිරිව තිබුණු මුදල පිළිවෙලින් සියයට 201, සියයට 348, සියයට 164 සහ සියයට 369 ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට පොදු අරමුදල් ශේෂය රු.මිලියන 205 ක් විය. මෙම මුදල් අරමුදල් පනතේ 7 වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් යෙදවීමකින් තොරව  විවිධ ආයෝජනයන්හි  යොදවා තිබුණි.

(ඇ) මානසික සෞඛ්‍ය පුහුණුව සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.384,560 ක මුදල උපයෝජනය නොකර 2015 වර්ෂයේදී එම සංවිධානය වෙත ආපසු යවා තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

ජාතික සම්පත ලොතරැයි ටිකට් පතක මිල රු.20 දක්වා වැඩි කළ පසු හෝ, එම ටිකට්පත් අලෙවිය වර්ධනය වූ පසු අරමුදල වෙත කරනු ලබන දායකත්වය නැවත වැඩි කිරීමට සලකා බලන බවට වූ එකඟතාවය මත එම ලොතරැයියෙන් අරමුදලට ලබාදෙන දායකත්වය සියයට 15 සිට සියයට 10 දක්වා අඩු කිරීමට 2008 වර්ෂයේදී තීරණය කර තිබුණි. 2007 වර්ෂයට සාපේක්ෂව 2013 සහ 2014 වර්ෂවලදී

ලොතරැයි ටිකට් අලෙවිය පිළිවෙලින් සියයට 10.6 කින් හා 16.9 කින් වර්ධනය වී තිබුණු අතර, ටිකට් පතක මිල 2008 සැප්තැම්බර් මාසයේදී රු.20 දක්වා වැඩිවී තිබුණි. නමුත් අරමුදල වෙත ලබා දෙන දායකත්වය නැවත වැඩි කර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

4.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

2012 සහ 2013 වර්ෂවලදී රු.5,688,900 ක් වැය කර Dengue Igm Elisa 96 Test Kit 150 ක් මිලදී ගෙන තිබුණි. ඉන් ඒකක 60 ක් හා ඒකක 90 ක් පිළිවෙලින් මාස 05 ක් හා මාස 10 ක් වැනි අඩු ජීව කාලයක් සහිත වූ බැවින් පිරිවැය රු.1,327,410 ක් වූ ඒකක 35 ක් කල් ඉකුත්වී තිබුණි. තවද පිරිවැය රු.1,820,448 ක් වූ ඒකක 48 ක් කල් ඉකුත් වීමෙන් පසු පාවිච්චි කර තිබුණි.

මෙම පරීක්ෂණ කට්ටල එකකින් පරීක්ෂණ 96 ක් සිදු කිරීමට හැකියාව ඇති බැවින්, 2014 දෙසැම්බර් 31 දින වන විට සිදුකර තිබුණු මුළු පරීක්ෂණ සංඛ්‍යාව 5201 ක් සඳහා අවශ්‍ය කරන පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව 55 ක් පමණක් විය. නමුත් එම කාලය තුළදී පරීක්ෂණ කට්ටල 102 ක් පාවිච්චි කර තිබූ බව වාර්තා කර තිබුණු බැවින් මුළු වටිනාකම රු.1,782,522 ක් වූ පරීක්ෂණ කට්ටල 47 ක් සම්බන්ධයෙන් අක්‍රමිකතාවක් සිදුවී නොතිබේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකිය.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම්, නඩත්තු හා වෙනත් කාර්යයන් 05 ක් වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.5,688,380 ක් වූ පරිත්‍යාග මුදල් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණු අතර එම මුදල් වර්ෂ 06 සිට වර්ෂ 11 දක්වා කාල පරාසයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ද සොයිසා කාන්තා රෝහලේ ඉතා පැරණි ගොඩනැගිලි නවීකරණය කිරීමේ හා නඩත්තු කිරීමේ අරමුණින් 2004 වර්ෂයේදී පිහිටුවා තිබුණු අරමුදලක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,761,143 ක ශේෂයක් පැවතියදී, ගොඩනැගිලි කිහිපයක් පින්තාරු කිරීම සහ ජනෙල් තිර රෙදි දැමීම වැනි සුළු කාර්යයන් පමණක් සිදුකර තිබුණි. අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමට හා අරමුදල් වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට හෘද චිකිත්සාගාරයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුළදී රු.947,101 ක් වූ මහජනාධාර එකතුකර සෞඛ්‍ය සංවර්ධන අරමුදලට බැර කර තිබූ අතර 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අදාළ පාර්ශවයන් විසින් කිසිදු මුදලක් එකතු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ගන්නා සෙබළුන්ට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබා ගැනීම සඳහා 2008 වර්ෂයේදී රු.10,000,000 ක් හා වෛද්‍යවරුන්ගේ නිල නිවාස වැඩි දියුණු කිරීම, ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු හා ජල ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2009 වර්ෂයේදී රු.20,000,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පරිත්‍යාග කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.24,507,112 ක් අදාළ අරමුණු වෙනුවෙන් නොයොදා නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) මොණරාගල රෝහලට ස්කෑන් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2011 වර්ෂයේදී ලැබී තිබුණු රු.101,500 ක් එම කාර්යය සඳහා වැය නොකර වර්ෂ 3 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) 2013 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන 5 ක් ඉදිකිරීමේ කාර්යය ශ්‍රී ලංකා නාවික හමුදාවට භාර දී 2014 මැයි 21 දින වන විට මුදලින් රු.75,000,000 ක් ගෙවා තිබුණි. පිරිවැය රු.50,297,406 කට ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු බැවින් ඉතිරි වූ රු.24,702,594 ක් අරමුදල වෙත නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.6 **ආර්ථික නොවූ ගනුදෙනු**

ඖෂධ කළමනාකරණ අත්පොතේ විධිවිධානවලට අනුකූලව ගබඩාවන්හි උපරිම මාස 02 කට ප්‍රමාණවත් වන තොගයක් පමණක් පවත්වාගෙන යා යුතු වුවද, ඩෙංගු රසායනාගාර මිලදී ගැනුම් පිළිබඳ සිදු කළ නියැදි පරීක්ෂාවේදී ඇතැම් ද්‍රව්‍යයන්හි මාස 07 සිට මාස 150 ක කාල පරාසයක් දක්වා වටිනාකම රු.4,052,680 ක් වූ අධි තොග තත්ත්වයක් පැවතුණි.

4.7 **හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍ය ප්‍රමාණය හා ජීව කාලය පිළිබඳව සැළකිල්ලකින් තොරව, Thermo Read TM Tag DNA Polymerase 1000g වර්ගයේ Vials 25 ක් රු.242,500 ක් වැයකර 2013 මාර්තු මාසයේදී මිලදීගෙන තිබුණි. ඉන් ඒකකයක් පමණක් පාවිච්චි කර තිබුණු අතර පිරිවැය රු.232,800 ක් වූ ඒකක 15 ක් 2013 ඔක්තෝබර් මාසයේදී හා ඒකක 09 ක් 2014 මාර්තු මාසයේදී කල් ඉකුත්වී තිබුණි.

(ආ) 2013 මාර්තු මාසයේදී රු.870,000 ක් වැයකර මිලදීගෙන තිබුණු Viral Extraction Kit 10 ක් 2013 සැප්තැම්බර් මාසයේදී කල් ඉකුත්වී තිබුණු අතර, ඉන් කට්ටල 3 ක් කල් ඉකුත්වීමෙන් පසුව භාවිතා කර තිබුණි. පිරිවැය රු.435,000 ක් වූ කල් ඉකුත් වූ ඒකක 05 ක් ගබඩාවේ පැවතුණි.

(ඇ) අක්ෂි පටල එකතු කිරීමේ කාර්යය සඳහා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.15,037 ක් වූ ද්‍රව්‍ය 2014 මැයි මාසයේදී කල් ඉකුත් වී තිබුණි.

(ඈ) ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කිරීම හේතුවෙන් වර්ෂ 07 කට පෙර අවලංගු කර තිබුණු කොන්ත්‍රාත්තුවක රු.1,372,346 ක් වූ කාර්යසාධන සුරක්ෂණ ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

5.1 **ක්‍රියාකාරී සැලැස්ම**

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල ආරම්භවූ 1981 වර්ෂයේ සිටම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.2 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාළව අරමුදලෙහි ඇස්තමේන්තුගත වියදම් සහ තථ්‍ය වියදම් පිළිබඳව සැලකීමේදී සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් ඇස්තමේන්තු අගයට වඩා සියයට 41.5 කින් අඩුවී තිබුණු අතර, ලිපිද්‍රව්‍ය වියදම ඇස්තමේන්තු අගයට වඩා සියයට 70 කින් අඩුවී තිබුණි. එසේම කාර්යාල උපකරණ හා වාහන අළුත්වැඩියා සඳහා වර්ෂය තුළදී වියදම් දරා නොතිබුණි. ඒ අනුව අයවැය

ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) මූල්‍ය කළමනාකරණය
(ආ) මිලදී ගැනුම් පාලනය
(ඇ) ව්‍යාපෘති වියදම් පාලනය

ඇමුණුම 01

**ආදායම් හා වියදම් ප්‍රකාශනය**

**-----------------------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි දක්වා ඇත.

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය**

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ආදායම | | | | |
| ජාතික සම්පත ලොතරැයි ආදායම | 64,901,840 | | 61,357,280 | |
| පරිත්‍යාග | 151,032,180 | | 162,998,913 | |
| ආයෝජන පොලී | 23,080,887 | | 35,699,162 | |
| අනිකුත් ආදායම් | 35,616,537 | | 33,244,203 | |
| | | 274,631,444 | | 293,299,558 |
| වියදම | | | | |
| පරිපාලන වියදම් | 2,206,057 | | 2,004,795 | |
| මූල්‍ය හා අනෙකුත් වියදම් | 32,000 | | 24,150 | |
| සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් | 223,221,520 | | 338,410,992 | |
| | | 225,459,577 | | 340,439,937 |
| ඌනතාවය/ අතිරික්තය | | 49,171,867 | | (47,140,379) |
| පෙර වර්ෂ ගැලපුම් | | - | | 239,596 |
| | | 49,171,867 | | (46,900,783) |
| | | ========== | | ========== |

ඇමුණුම 02

මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශනය

ස්ථාවර තැන්පත් (මහජන බැංකුව)

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2014 ජනවාරි 01 දිනට ශේෂය | 2014 වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2014 වර්ෂයේ ආපසු ගැනීම් | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 865632 | 2013/12/21 | මාස 3 | 63,000,000 | - | - | 63,000,000 |
| 865633 | 2013/12/21 | මාස 3 | 23,000,000 | - | - | 23,000,000 |
| 865615 | 2013/12/14 | මාස 3 | 20,000,000 | - | | 20,000,000 |
| 865614 | 2013/12/14 | මාස 3 | 20,000,000 | - | - | 20,000,000 |
| 865616 | 2013/12/14 | මාස 3 | 15,000,000 | - | - | 15,000,000 |
| 331419 | 2013/10/08 | මාස 3 | 1,500,000 | - | - | 1,500,000 |
| 379711 | 2012/03/14 | අවු: 1 | 10,000,000 | - | 10,000,000 | - |
| 865606 | 2013/12/05 | මාස 3 | 50,000,000 | - | - | 50,000,000 |
| 865627 | 2013/12/21 | මාස 3 | 35,000,000 | - | - | 35,000,000 |
| | | | 237,500,000 | | 10,000,000 | 227,500,000 |

භාණ්ඩාගාර බිල්පත් (ලංකා බැංකුව)

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2014 ජනවාරි 01 දිනට ශේෂය | 2014 වර්ෂය තුළ ආයෝජනය කිරීම් | 2014 වර්ෂයේ ආපසු ගැනීම් | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | දින | රු. | රු. | රු. | රු. |
| 314 | 2014/02/21 | 350 | 15,863,144 | - | - | 17,540,972 |
| 314 | 2014/12/26 | 182 | 4,816,955 | - | - | 4,863,815 |
| 314 | 2014/08/29 | 182 | 40,038,124 | - | - | 40,477,098 |
| M 13 B 026845 | 2014/12/29 | 04 | 5,000,000 | 16,000,000 | 5,000,000 | 16,000,000 |
| M 13 B 026303 | 2014/12/29 | 13 | 9,000,000 | 35,000,000 | 9,000,000 | 35,000,000 |
| | | | 74,718,223 | 51,000,000 | 14,000,000 | 113,881,885 |